# තැපැල් ඡන්දයට බාධා වුණොත්
# ඡන්ද විමසීම අවලංගුයි

## මැතිවරණ නිරීක්ෂණයට පැෆරල් හා මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය පමණයි - මැතිවණ කොමිෂන් සභාව

**ඉන්දික හේවාවිතාරණ**

තැපැල් ඡන්දය සලකුණු කිරීමේ ස්ථානයක ඡන්දයට බාධාවන හෝ ඡන්දය ලබාදීමට බලපෑමක් සිදුවන ක්‍රියාවක් සිදු වුවහොත් එම ස්ථානයේ ඡන්ද විමසීම අවලංගු කිරීමට මැතිවණ කොමිෂන් සභාව සැලසුම් කර තිබේ.

තැපැල් ඡන්දය පැවැත්වෙන දිනවල අදාළ ස්ථානවලට ආරක්ෂාව ලබාදෙන ලෙසට තේරීම් භාර නිලධාරීවරයා හෝ සහතික කිරීමේ නිලධාරියා ඉල්ලා සිටියහොත් ඒ සඳහා සහාය ලබාදෙන ලෙසට මැතිවරණ කොමිෂන් සභාව පොලිස්පතිවරයාගෙන් ඉල්ලා සිට ඇත.

තැපැල් ඡන්දය සලකුණු කරන ස්ථාන සඳහා එක් අපේක්ෂකයෙකු වෙනුවෙන් එක් නියෝජිතයෙකු හා නිරීක්ෂණ ආයතනවලින් එක් නියෝජිතයෙකු ලෙස පත්කළ හැකි බව මැතිවරණ කොමිෂන් සභාව සඳහන් කරයි.

අදාළ නිරීක්ෂණ කටයුතු සඳහා පැෆරල් සංවිධානයට හා මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානයට (CMEV) ආයතනවලට අවස්ථාව ලබා දී ඇත.

සලකුණු නොකළ හෝ සලකුණු කළ ඡන්ද පත්‍රිකා ඡායාරූප ගැනීම සහ අන් අයට ප්‍රදර්ශනය කිරීම සපුරා තහනම් වන අතර, තැපැල් ඡන්ද පැවැත්වෙන ස්ථාන ඡායාරූපගත කිරීමත්, වීඩියෝගත කිරීමත් තහනම් කර තිබේ. තැපැල් ඡන්ද විමසීම මේ මස 31, නොවැම්බර් 01, 04, 05 සහ 07 යන දිනවල පැවැත්වේ.